www.wsws.org ලෝක සමාජවාදී වෙබ් අඩවිය
හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# ශ්‍රී ලංකා ජනාධිපති "ජාත්‍යන්තර කුමන්ත්‍රනයක්" සොයාගනී

## Sri Lankan president invents an "international conspiracy"

**විලානි පීරිස් විසිනි**

**2009 ඔක්තෝබර් 14**

ශ්‍රී ලංකා හමුදාව, බෙදුම්වාදී දෙමල ඊලම් විමුක්ති කොටි (එල්ටීටීඊ) සංවිධානයේ ඉහල නායකත්වයෙන් බහුතරයක් ඝාතනය කරමින්, මැයි මාසයේ එල්ටීටීඊ පාලනය යටතේ තිබූ අවසන් ප්‍රදේශය ද අල්ලා ගත්තේය. යුද්ධය අවසන්ව ඇති නමුදු, එයට තුඩු දුන් යටින් පැවති දේශපාලන හේතු එකක් වත් විසඳාලීම කෙසේවෙතත්, ඒවාට ආමන්ත්‍රනය කර වත් නැත. අනුප්‍රාප්තික කොලඹ ආන්ඩු, සිය දැවෙන ගැටලු අරභයා වැඩ කරන ජනතාව වෙතින් නැගෙන විරුද්ධත්වය අපසරනය කොට, භේද කොට මැඩීම පිනිස වසර 26ක් තිස්සේ දෙමල විරෝධී යුද්ධය ගසාකා තිබේ.

දැන් යුද්ධයක් නැති තතු තුල, ජනාධිපති මහින්ද රාජපක්ෂ එම දෘෂ්ටිවාදාත්මක හිස්තැන පිරවීම පිනිස "ජාත්‍යන්තර කුමන්ත්‍රනයක්" අලුතෙන් සොයාගෙන තිබේ. කොලඹ මාධ්‍යවල පිටුබලය සහිතව, ආන්ඩුව, ශ්‍රී ලංකා මිලිටරියේ නම කෙලසන බවට ද "කොටි ත්‍රස්තවාදීන්ට" එරෙහි එහි "විජයග්‍රහනයට" වල කපන බවට ද නම් නොකරන ලද බලවේග හා ඔවුන්ගේ දේශීය සම-කුමන්ත්‍රනකරුවන් හෙලාදැකීමේ ව්‍යාපාරයක, නිරන්තරව යෙදී සිටී. මෙම "කුමන්ත්‍රනය" ආන්ඩුවේ සෝෂාබද්ධ ජාත්‍යෝන්මාදය සමග වෙලී ඇති අතර එහි යුද අපරාධ හා ප්‍රජාතන්ත්‍ර විරෝධී විධික්‍රම විවේචනය කරන ඕනෑම අයෙකු හෙලාදැකීමට ද එය යොදා ගැනෙයි.

පසුගිය සෙනසුරාදා පැවති දකුනු පලාත් සභා මැතිවරනය සඳහා ආන්ඩුව ගෙන ගිය උද්ඝෝෂනය තුල මෙම තේමාව ප්‍රමුඛ තැනක් ගත්තේය. ඔක්තෝබර් 7 දා පැවති මැතිවරන රැලියක් අමතමින් රාජපක්ෂ මෙසේ ප්‍රකාශ කලේය: "බොරු ද්වේෂ සහගත චෝදනා ගොතමින්, රටේත් රන විරුවන්ගේත් ප්‍රතිරූපය කෙලසන්න ජාත්‍යන්තර ප්‍රජාවේ කොටසක් තමන්ගේම අවශ්‍යතාවන් සහිත දේශීය ඒජන්තයන් කිහිප දෙනෙකුගේත් උදව් ඇතිව කුමන්ත්‍රනයක් ගෙන යනවා.... සෙසු රටවල් සමග අපට ශක්තිමත් මිත්‍රශීලී සම්බන්ධතා තියෙනවා වුනත් අපි සූදානම් නැහැ අයුක්ති සහගත හා අසාධාරන කොන්දේසි ඉස්සරහ ඔලුව නමන්න. අපි කිසිදාක මව්බිමේ ගෞරවය පාවාදෙන්නේ නැහැ. ඒකට අනෙක් හැම දේටම වඩා මුල් තැන ලැබෙනවා."

මෙහි සැඳහුම් කෙරෙන "කුමන්ත්‍රනය" ඇරඹුනේ මැයි මාසයේ ය. ඒ එක්සත් ජනපදයේ පිටුබලය සහිතව, යුරෝපා බලවතුන් ගනනාවක්, ශ්‍රී ලංකාවේ යුද අපරාධ පිලිබඳ සීමිත පරීක්ෂනයක් ද දෙමල සිවිල් වැසියන් 250,000කට වඩා ගාල් කර ඇති රැඳවුම් කඳවුරුවලට වැඩි ප්‍රවිෂ්ටයක් ද ඉල්ලා සිටිමින් එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් මන්ඩලයේ යෝජනාවක් සම්මත කිරීමට උත්සාහ කල විටය. යුද්ධයේ අවසන් සති ගනනාව තුල, එල්ටීටීඊ පාලනය යටතේ ඉතිරිව පැවති භූමි ප්‍රදේශ මත ඉවබවක් නැති ප්‍රහාර එල්ල කිරීම මගින් සිවිල් වැසියන් දහස් ගනනක් මරා දැමීම සම්බන්ධයෙන් මිලිටරිය වගකිව යුතු විය.

එක්සත් ජනපදය හා එහි සගයන් ඇෆ්ඝනිස්ථානයේ හා ඉරාකයේ ගෙන යන ජනඝාතක නව-විජිතවාදී යුද්ධ සැලකූ කල, මෙම යෝජනාව මුලුමනින්ම කුහක එකක් විය. එහි අරමුන වූයේ යුද්ධයට "දේශපාලන විසඳුමක්" පිලිබඳ එක්සත් ජනපදයේ හා යුරෝපීය බලයන්ගේ ඉල්ලීම පිලිගැනීම ද කොලඹ මත්තෙහි එහි ප්‍රතිවාදීන්ට, විශේෂයෙන් ම චීනයට, එරෙහිව වොෂිංටනයේ ආනුභාවය වැඩිදියුනු කිරීම ද පිනිස රාජපක්ෂ ආන්ඩුව මත පීඩනය යෙදීමය. චීනයේ, රුසියාවේ හා ඉන්දියාවේ පිටුබලය සහිතව, ශ්‍රී ලංකා ආන්ඩුව එම යෝජනාව සම්මත වීම වලක්වා, "ත්‍රස්තවාදයට එරෙහි යුද්ධය" තුල එය ලැබූ ජයග්‍රහනයට ප්‍රශංසා කරන නරුම ප්‍රති-යෝජනාවක් සම්මත කරගත්තේය.

ශ්‍රී ලංකාව මත එක්සත් ජනපදය හා යුරෝපා බලවතුන් දිගටම පවත්වා ගෙන යන පීඩනය "කුමන්ත්‍රනය" ජීවමානව තබා ගෙන සිටී. එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් මන්ඩලයේ දී අසාර්ථකත්වයට පත් වීමෙන් පසුව, එක්සත් ජනපදය,

ශ්‍රී ලංකා ආර්ථිකය ගැඹුරින් අර්බුදයේ ගිලෙද්දී වඩාත් අවශ්‍යව පැවති ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ නය මුදලක් මාස ගනනාවක් තිස්සේ හිර කරගෙන සිටියේය. මානව හිමිකම් උල්ලංඝනය සම්බන්ධයෙන් පරීක්ෂනයක් පැවත්වූයේ නැතිනම් ශ්‍රී ලංකාවේ අපනයන සඳහා ලැබෙන පොදු ප්‍රමුඛතා ක්‍රමයේ (ජීඑස්පී) සහන නතර කරන බවට යුරෝපා කොමිෂම තර්ජනය කර තිබේ. ඇගලුම් හා සෙසු අපනයනවලට ලැබෙන සහන නැති වීම, ශ්‍රී ලංකාවට එ.ජ. ඩොලර් මිලියන 150ක පමන අපනයන අහිමි කල හැකිය.

එක්සත් ජනපද හා යුරෝපා නිලධාරින්ගේ සීමිත විවේචන ගින්නට තවත් තෙල් එක් කර තිබේ. සැප්තැම්බර් 30 දා, එක්සත් ජනපද රාජ්‍ය ලේකම් හිලරි ක්ලින්ටන් එක්සත් ජාතීන්ගේ ආරක්ෂක මන්ඩලයේ දී මෙසේ ප්‍රකාශ කලේය: "බොස්නියාවේ, බුරුමයේ හා ශ්‍රී ලංකාවේ දී සහ වෙනත් තැන්වල දී ස්ත්‍රී දූෂනය යුද උපායක් ලෙස යොදා ගන්නවා අපි දැක ඇත්තෙමු." එම ප්‍රකාශය කොලඹ මාධ්‍ය තුල මහත් කලබැගෑනියක් ද ශ්‍රී ලංකාවේ ආන්ඩුව වෙතින් විරෝධතා ද ඇවිලවීය. එක්සත් ජනපද රාජ්‍ය දෙපාර්තමේන්තුවේ ප්‍රකාශිකාවක්, ශ්‍රී ලංකාවේ මිලිටරිය අවියක් ලෙස ස්ත්‍රී දූෂනය යොදා ගන්නා බවට වාර්තා නොමැති අතර, කෙසේ වෙතත් කොලඹ ආන්ඩුව "අනාගතය වෙත වඩා අවධානය යොමු කොට සාමය ප්‍රවර්ධනය කිරීම හා මානව හිමිකම් ආරක්ෂා කිරීම මත ඉදිරියට යා යුතු" බව සඳහන් කලාය.

මහ බලවතුන්ගේ විරුද්ධවාදියකු ලෙස රාජපක්ෂ කරන පෙනී සිටීම විකාරයකි. ඔහුගේ ආන්ඩුව එක්සත් ජනපදය හා යුරෝපය සමග සිය මතභේද සමනය කරගැනීමේ මංමුලා සහගත උත්සාහයක යෙදී සිටින බැවින් ඔහු "බටහිර කුමන්ත්‍රනකරුවන්" නම් කිරීමට පවා අසමත් වේ. සිය මානව හිමිකම් වාර්තාව පිලිබඳ මොන යම් හෝ පරීක්ෂනයක් ප්‍රතික්ෂේප කරන අතරම, ශ්‍රී ලංකා ආන්ඩුවේ ගැටලුව පැහැදිලි කොට ජීඑස්පී සහන දිගටම පවත්වා ගෙන යාම සඳහා තර්ක කරනු පිනිස ජනාධිපති සිය සොහොයුරු හා උපදේශක බැසිල් රාජපක්ෂ යුරෝපයට යවා තිබේ.

කෙසේ වෙතත්, ගිලෙන්න යන මිනිහා පිදුරු ගහේ එල්ලෙන්නාක් මෙන්, රාජපක්ෂ සිය "බටහිර කුමන්ත්‍රන" කතාවේ එල්ලී සිටී. ආන්ඩුව පලාත් සභා මැතිවරන මාලාවක් පහසුවෙන් ජයගෙන ඇතත් එම ප්‍රතිඵල රැවටිලි සහගතය. ප්‍රධාන විපාර්ශ්වික පක්ෂ -- එක්සත් ජාතික පක්ෂය සහ ජනතා විමුක්ති පෙරමුන -- වැඩ කරන ජනතාව සඳහා කිසිදු විකල්පයක් සපයන්නේ නැත. ඔවුහු යුද්ධයට පිටුබලය සපයා එම ජයග්‍රාහී උත්සවවලට එක්වූ අතර තමන් රටේ හොඳ නම කෙලෙසීමේ කුමන්ත්‍රනයක කොටස්කරුවන් නොවන බවට දැඩි ලෙස කියා සිටිති. කම්කරුවන් හා ග්‍රාමීය දුගීන් මුහුන දෙන ආර්ථික හා සමාජ ගැටලුවලට ඔවුන් එක් පාර්ශ්වයක් අත වත් කිසිදු විසඳුමක් නැත.

කෙසේ වෙතත්, මහජන අතෘප්තිය හා වෛරය නැගෙමින් පවතී. යුද්ධය හමාර වී මාස පහක් ගතවී ඇති තැන, යුද්ධයේ අවසානය සාමයේ හා සෞභාග්‍යයේ නව කාල පරිච්ඡේදයක් විවෘත කරන බවට රාජපක්ෂ කල කියාපෑමෙහි පල්ල යමින් තිබේ. එහි දැවැන්ත මිලිටරි වියදම් මගින් නිර්මානය කරන ලද හා ගෝලීය ආර්ථික පසුබෑස්ම මගින් තව දුරටත් සංකීර්න කරන ලද ගැඹුරු වන ආර්ථික අර්බුදයකට ආන්ඩුව මුහුන දී සිටී. විරැකියාව, වසරේ පලමු වන කාර්තුවේ තිබූ සියයට 5.2 සිට දෙවන කාර්තුවේ දී සියයට 6.3 දක්වා ඉහල නැගුනි. ආන්ඩුවේ සංඛ්‍යා ලේඛනවලට අනුව, 2009 වසරේ දෙවන කාර්තුව තුල දී කාර්මික අංශයේ රැකියා 155,000ක් අහිමි වී තිබේ. අවසානයේ ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ නය මුදල ලැබී ඇති තතු තුල, ආන්ඩුව සමාජ වියදම් හා මිල සහනාධාර රුදුරු ලෙස කප්පාදු කිරීමට මෙන් ම පුද්ගලීකරනය වේගවත් කිරීමට හා වැටුප් පහල මට්ටමේ තබා ගැනීමට ද සූදානම් වේ.

සමාජ අසන්තෘප්තිය පිපිරී ඒම ගැන බියපත්ව, ආන්ඩුව යුද්ධයේ ක්‍රියාදාමය තුල දි ගොඩනගන ලද දැවැන්ත පොලිස් රාජ්‍ය ආරක්ෂක යාන්ත්‍රනය පවත්වා ගෙන විත් තිබේ. විපාර්ශ්වයේ පක්ෂවල පිටුබලය සහිතව, පාර්ලිමේන්තුව, ජනාධිපතිට පුලුල් ප්‍රජාතන්ත්‍ර විරෝධී බලතල ලබා දෙන පවත්නා හදිසි නීති රෙගුලාසි අනුමත කිරීමේ දිගටම යෙදී සිටී. හමුදාව විසුරුවා හරිනු වෙනුවට, එය ප්‍රසාරනය කෙරෙන අතර දිවයිනේ උතුර හා නැගෙනහිර නිත්‍ය මිලිටරි වාඩිලෑමක් සඳහා කටයුතු සූදානම් කෙරෙයි. රට පුරා, මැනවින් සන්නද්ධ පොලිස් භටයන් හා සොල්දාදුවන් සේවයේ යොදවා ඇති මාර්ග බාධක හා සෝදිසි කපොලු පවත්වා ගෙන යයි. නිවහන් ප්‍රදේශ පීරමින් කෙරෙන සෝදිසි මෙහෙයුම්, නඩු විභාග නොමැතිව හිතුමතේ රඳවාගැනීම් සහ ආන්ඩුවට හිතැති ඝාතක කල්ලි විසින් කෙරෙන "අතුරුදහන් කිරීම්" දිගටම සිදු කෙරෙයි.

මෙම රුදුරු පියවර සඳහා යුක්තිකරනයන් සොයා ගැනීමට ආන්ඩුවට බල කෙරී ඇත. "ජාත්‍යන්තර කුමන්ත්‍රනය" සමග එක පෙලට, ආන්ඩුව සියල්ල මිලිටරිවාදයේ භාෂාව තුල පදම් කරයි. එල්ටීටීඊයේ පරාජයෙන් පසුව වහාම රාජපක්ෂ "ජාතිය ගොඩනැගීම" පිනිස "ආර්ථික යුද්ධයක්" නිවේදනය කලේය. එනම්. ධනපති ලාභ ආරක්ෂා කරනු පිනිස වැඩ කරන ජනතාවගෙන් නව "කැපකිරීම්" ඉල්ලා සිටීමයි. අපරාධකරුවන් යයි කියනු ලබන අය අධිකරන ක්‍රියාමාර්ගවලින් පරිබාහිරව මරාදැමීම යුක්තියුක්ත කරනු පිනිස "පාතාල ලෝකයට එරෙහි යුද්ධයක්" ද ඔහු ප්‍රකාශයට පත් කර තිබේ.

එමෙන්ම, ආරක්ෂක අමාත්‍යංශය. මිලිටරිය හා පොලීසිය, රට තුල විෂඝෝර වාර්ගික වාතාවරනය පවත්වා ගෙන යනු පිනිස අනවරත බියගැන්වීමේ කතාන්දර මාලාවක් පවත්වා ගෙන යයි. එල්ටීටීඊ "ත්‍රස්තවාදීන්" අත්අඩංගුවට ගැනීම සහ මරාගෙන මැරෙන බෝම්බකරුවන්ගේ ජැකට් හා දැවැන්ත ආයුධ හා උන්ඩ තොග සොයාගැනීම පිලිබඳ දිනපතා නිවේදන නිකුත් කෙරෙමින් පවතී. යමෙක් කොලඹ මාධ්‍ය මත විශ්වාසය තබන්නේ නම් යුද්ධය තවම අවසන්ව නැතිවාක් මෙනි.

මෑත පලවූ මාධ්‍ය සිරස්තල කිහිපයක් එහි සාරය පෙන්නුම් කරයි: "පුදුකුඩිඉරුප්පුවේ දී පුපුරන ද්‍රව්‍ය කිලෝ තිහක් සොයා ගනී", "කොටින්ට උදව් කල වෛද්‍යවරයෙක් අල්ලා ගනී" සහ "කොටි පුපුරන ද්‍රව්‍ය පිරවූ වෑන් රියක් අල්ලා ගනී. ඒවා කොලඹට ගෙන ඒමට සැලසුම් කරලා". පසුගිය සතියේ දී හදිසි නීතිය තව දුරටත් දීර්ඝ කරනු පිනිස තර්ක කරමින්. අගමැති රත්නසිරි වික්‍රමනායක ප්‍රකාශ කලේ, "ත්‍රස්තවාදීන් පරාජය කෙරුවා" වුවත් තර්ජනය තවමත් පවතින බවයි.

ශ්‍රී ලංකාවේ වැඩ කරන ජනතාවට එරෙහිව සැබෑ කුමන්ත්‍රනනය සිදු කරනු ලබන්නේ ආන්ඩුව සහ සමස්තයක් ලෙස කොලඹ දේශපාලන සංස්ථාපිතය විසිනි. ප්‍රජාතන්ත්‍ර අයිතීන් හා ශිෂ්ඨ සම්පන්න ජීවන මට්ටම් සඳහා කම්කරුවන්ට හා දුගීන්ට පවත්නා අභිලාෂයන් සපුරාලීමට මුලුමනින්ම අපොහොසත්ව, එය දෙමල විරෝධී වර්ගවාදයේ. කුමන්ත්‍රන න්‍යායන්ගේ, අර්ධ සත්‍යයන්ගේ හා අසත්‍යයන්ගේ ප්‍රචාරක ව්‍යාපාරයක් දිගටම පවත්වා ගෙන යන්නේ, සිය රැකියා, සේවා හා ජීවන කොන්දේසි මත එල්ල කෙරෙන ප්‍රහාරයන්ට එරෙහිව කම්කරු පන්තිය වෙතින් මතු වන මොන යම් හෝ විරුද්ධත්වයක් මැඩලීමේ පොලිස් රාජ්‍ය විධික්‍රම සූදානම් කරන අතරය.

© www.wsws.org